# තනතුරු ඇබෑර්තු
## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2018.10.22 දින දක්වා ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

### බෞද්ධ අධ්‍යයන පීඨය

1. ප්‍රමුඛ මහාචාර්ය (බෞද්ධ දර්ශනය)
2. ප්‍රමුඛ මහාචාර්ය (පාලි)

### භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය

**සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය**

3. ප්‍රමුඛ මහාචාර්ය (අධ්‍යාපන විද්‍යාව)
4. ආධුනික කථිකාචාර්ය/ කථිකාචාර්ය/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/ I ශ්‍රේණිය (මනෝවිද්‍යාව)
5. ආධුනික කථිකාචාර්ය / කථිකාචාර්ය/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/ I ශ්‍රේණිය (දර්ශනය)

**භාෂා අධ්‍යයන අංශය**

6. ප්‍රමුඛ මහාචාර්ය (සිංහල)
7. ආධුනික කථිකාචාර්ය / කථිකාචාර්ය/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/ I ශ්‍රේණිය (සිංහල)

**සැ.යු.**

- ඉහත අධ්‍යයන තනතුරු සඳහා ඉල්ලුම් කළ හැක්කේ බෞද්ධ භික්ෂූන් වහන්සේට පමණි.
- ඉහත තනතුරු සඳහා අයදුම් කරන ස්වාමීන් වහන්සේට ඉංග්‍රීසි හා සිංහල යන භාෂා දෙකෙන්ම ඉගැන්වීමේ හැකියාව තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- ආචාර්ය තනතුරකට පත්කළහොත් එසේ පත්කළ දින සිට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට අවම වශයෙන් වසර 05ක් සේවය කළ යුතුය.

8. ඉංග්‍රීසි භාෂා උපදේශක (iii ශ්‍රේණිය)

### අනධ්‍යයන /පරිපාලන තනතුරු

9. සහකාර මූල්‍යාධිකාරී
10. සහකාර ලේඛකාධිකාරී
11. පරිපාලක (සිවිල්) (iii ශ්‍රේණිය)

**අනෙකුත් ප්‍රතිලාභ**

- ඉහත තනතුරු සඳහා වැටුප්වලට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත අනෙකුත් දීමනා ද හිමි වේ.
- මහාචාර්ය සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු සඳහා සප්ත වාර්ෂික නිවාඩු හිමිකම් හා එම නිවාඩු විදේශයක ගතකරන්නේ නම් ඒ සඳහා යානාපත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව හිමි වේ.
- විශ්වවිද්‍යාල සේවයට බඳවාගනු ලබන අයට විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබේ. (අර්ථසාධක අරමුදල සඳහා නිලධාරියාගේ වැටුපෙන් 10% ක මුදලක් සහ විශ්වවිද්‍යාලය මගින් 15%ක මුදලක් බැර කෙරේ.) සේවක භාරකාර අරමුදලට 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් බැර කරනු ලැබේ.

**<u>අයදුම්පත්</u>**

- අයදුම්පත් හා අනෙකුත් විස්තර මෙම විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන) වෙතට ඉල්ලුම් කරන තනතුර ඇතුළත් ලිපියක් සමග සෙ.මී. 23X10 ප්‍රමාණයේ ලිපිනය සහිත, මුද්දර ඇලවූ ලියුම් කවරයක් එවීමෙන් ලබාගත හැකි අතර අයදුම්පත් හා විස්තර www.busl.ac.lk වෙබ් අඩවියෙන් ද බාගත කරගත හැක.
- එක් අයෙකු තනතුරු එකකට වඩා ඉල්ලුම් කරන අවස්ථාවක ඒ එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය.
- මහාචාර්ය තනතුර සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 916 ප්‍රකාරව අදාළ අයදුම්පත් සකස් කරගත යුතුය.

**<u>අයදුම්කරන පිළිවෙළ</u>**

- සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග ඊට අදාළ සහතිකවල පිටපත් හා ඉහත චක්‍රලේඛ ප්‍රකාර ලේඛන සමග ලියාපදිංචි තැපෑලෙන් **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, (ආයතන) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර** යන ලිපිනයට 2018.10.22 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. මහාචාර්ය තනතුර සඳහා පමණක් අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනය 2018.11.02 වේ.
- අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- විශ්වවිද්‍යාල/රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන වල සේවයේ නියුතු අය තම අයදුම්පත් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
- නියමිත ආකෘතියෙන් ඉදිරිපත්කර නොමැති, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්කරුවන් කෙටි ලේඛන ගත කිරීම හා එම අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,**
2018.09.23